# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/12/වා.ස්.මා/

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2026.01.14

ප්‍රධාන කාර්යාලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් ඇතුළු අංශ ප්‍රධානීන්,
සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා
දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරින් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා ප්‍රජාමූල බැංකු පද්ධතිය තුල සේවය කරන නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය - 2026</u>**

2026 වර්ෂයේ අන්තර් දිස්ත්‍රික් වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරන ලද මෙම ලේඛනයට අමුණා ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා ප්‍රජාමූල බැංකු පද්ධතිය තුළ සේවය කරන නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලබාදීමට අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු මණ්ඩලය නිර්දේශ කර ඇත. ඒ අනුව එම ස්ථාන මාරුවීම් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන අතර, 2026.04.01 දින සිට මෙම නිලධාරින්ට නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි නිදහස් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

02. මීට පෙර වර්ෂවල අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු වීම් ක්‍රියාත්මක වී නොමැති බවට වාර්තා වී ඇත. එබැවින් අන්තර් දිස්ත්‍රික් මාරු මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අනුව මෙම මාරුවීම නිලධාරීන්ගේ ස්ථිර පදිංචි ස්ථාන හා පෞද්ගලික හේතූන් සැළකිල්ලට ගෙන සිදුකර ඇති බැවින් අදාල නිලධාරින් නව සේවා ස්ථානවලට නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.

03. මෙම නිලධාරින් අදාළ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය වෙත සේවයට වාර්තා කර දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ මඟින් මා වෙත දැන්විය යුතුය.

04. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

05. මේ සම්බන්ධයෙන් මෙම නිලධාරින් අභියාචනා කරන්නේ නම් එම අභියාචනා 2026.01.30 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතුය.

06. පරිගණක ගත කිරීමත් සමඟ එම බැංකුවල ලේඛනගත (Manual) ඉවත් කිරීමේදී එම බැංකුවල සේවය කරන නිලධාරීන්ගේ අදාල කටයුතුවලට බාධාවක් සිදු නොවන පරිදි ස්ථාන මාරු කිරීම හෝ එම ස්ථාන මාරු ලබාදීම ප්‍රමාද කිරීමේ බලය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත පවරනු ලැබේ.

07. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ 2026 වර්ෂයේ ස්ථාන මාරු සියල්ල 2026.04.01 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

සී.ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ප්‍රධාන ගණකාධිකාරි - දැ.ගැ.ස.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) රා.ආ. - දැ.ගැ.ස.
4. පෞද්ගලික ලිපි ගොනුවට